# යහපාලනය සඳහා
# මණ්ඩල සාමාජිකයන් හට ප්‍රධාන හෝඩුවාවන් 10ක්

**01** ඔබගේ පුණ්‍යායතනයේ පුණ්‍ය අරමුණ කුමක්ද යන්න දැනගෙන ඔබ සහ ඔබගේ පුණ්‍යායතනය ඒ අරමුණ වෙනුවෙන් කටයුතු කරන බවට වග බලා ගන්න.  ඔබට සැකයක් ඇතිනම්, ඔබගේ කටයුතු මගින් ඔබගේ පුණ්‍යායතනයේ පුණ්‍ය අරමුණ ප්‍රවර්ධනය වන්නේද යන ප්‍රශ්නය ඔබගෙන්ම අසා ගන්න.

**02** ඔබගේ කාර්‍යභාරය සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් තබාගන්නා අතර ඔබගේ පුණ්‍යායතනයේ සිටින, ස්වේච්ඡා සේවකයන්, සාමාජිකයන්, මණ්ඩල සාමාජිකයන්, සේවාදායකයන් හෝ සේවකයන් යන සෑම අයෙකුම සිය කාර්‍යභාරය සහ වගකීම් සම්බන්ධයෙන් හොඳ අවබෝධයකින් සිටින බවට වග බලා ගන්න.

**03** ඔබගේ පුණ්‍යායතනයේ මූල්‍ය තත්වය සම්බන්ධයෙන් අබබෝධයෙන් සිටින්න එසේම එහි මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අවබෝධයෙන් සිටින්න. ඔබගේ මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුම ඔබගේ පුණ්‍යායතනයේ මුදල් ඉතා හොඳින් කළමණාකරණය කිරීමේ වගකීම බෙදාහදා ගන්නා බවට වගබලා ගත යුතුය.

**04** මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් තීරණ ගැනීමේදී  මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ඔබගේ වගකීම් සහ නෛතික යුතුකම් සිතෙහි තබා ගන්න. දුෂ්කර තීරණ ගැනීමේදී මෙය විශේෂයෙන් වැදගත්වේ.

**05** ඔබගේ රීතීන් සම්බන්ධ පිටපතක් තබා ගන්න: ඒවා කියවන්න, අවබෝධ කර ගන්න, ඒ අනුව කටයුතු කරන්න. කිසියම් දෙයක් සම්බන්ධයෙන් සැකයක් ඇතිනම්, ඔබගේ අනෙකුත් මණ්ඩල සාමාජිකයන්ගෙන් විමසන්න, නැතිනම් වෘත්තීය උපදෙස් ලබා ගන්න.

**06** මණ්ඩල සාමාජිකයන් කණ්ඩායමක් වශයෙන් කටයුතු කලද, අනෙක් අය කරන දේ විචාරයක් නැතිව කිරීමෙන් වළකින්න. ඔබ විසින් සැමවිටම ඔබගේ පුණ්‍යායතනයේ හොඳම සුබසිද්ධිය සඳහා කුමක් කල යුතුද යන්න ඔබ සිතන ආකාරයට කටයුතු කල යුතුය.  සමහර අවස්ථාවල අනෙකුත් මණ්ඩල සාමාජිකයන්ගේ අදහස්වලට වෙනස් අදහසක් දැරීම වුවද මෙයින් අදහස්වේ.

**07** ඔබගේ පුණ්‍යායතනය රජයේ ආයතන (ACNC සහ වෙනත් නියාමක ආයතන) කෙරෙහි ඇති වගකීම අවබෝධ කර ගන්න. එසේම ඔබගේ පුණ්‍යායතනය එම අවශ්‍යතාවයන් සපුරාලන බවට වග බලා ගන්න.

**08** අනෙකුත් මණ්ඩල සාමාජිකයන් හට සවන්දී කණ්ඩායමක කොටසක් වශයෙන් කටයුතු කරන්න. ඔබගේ මණ්ඩලය සංවිධානය සම්බන්ධයෙන් සාමූහික වගකීමක් දරණ අතර මණ්ඩල සාමාජිකයන්ව ඔබ දැකිය යුත්තේ එකට රැකියාව කරන අය වශයෙනි.

**09** ඔබට ඇති උනන්දුවලට පිළිගැටුම් (conflicts of interest) ඇතිවිට වගකීමෙන් යුතුව ඒවා ප්‍රකාශයට පත් කිරීමට සහ කළමණාකරණය කිරීමට විශ්වාසීව කටයුතු කරන්න. මණ්ඩලයක ඇති බොහෝ සාමාජිකයන් පිළිගැටුම් අවස්ථාවලට මුහුණ දෙන අතර ඔබ විසින් ඒවා සම්බන්ධයෙන් විශ්වාසයෙන් කටයුතු කල යුතුය.

**10** සෑම විටම ඔබගේ පුණ්‍යායතනයේ සුබසිද්ධිය වෙනුවෙන් කටයුතු කල යුතු අතර, මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ඔබගේ පුද්ගලික උනන්දුවලට ඉහලින් ඔබගේ පුණ්‍යායතනයේ උනන්දු තැබීමට ඔබට වගකීමක් ඇත.

**ACNC** හා සම්බන්ධ වන්න
දුරකථනය: 13 ACNC (13 22 62)
ඊමේල්: advice@acnc.gov.au
තැපැල්: Advice Services, Australian Charities and Not-for-profits Commission, GPO Box 5108, Melbourne VIC 3001
ෆැක්ස්: 1300 232 569

ඉංග්‍රීසි හැර වෙනත් භාෂාවකින් සන්නිවේදනය කිරීම සඳහා, ඔබ හට නොමිළේ ලබාගත හැකි පරිවර්තන සහ තෝල්ක සේවාව (Translating and Interpreting Service (TIS)) හා සම්බන්ධ වන්න. මෙම සේවාව භාවිතා කිරීම සඳහා 13 14 50 ඔස්සේ (TIS) අමතා භාෂා පරිවර්තකයෙකු හට 13 22 62 ඔස්සේ කථා කරන්න.

© Copyright 2015
මෙහි අඩංගුදේ ඔබට අවශ්‍ය ආකාරයට පිටපත් කිරීමට, අනුවර්තනය කිරීමට, වෙනස් කිරීමට, යැවීමට සහ බෙදාහැරීමට ඔබට හැකිය (ඔබව හෝ ඔබගේ සේවා සහ නිෂ්පාදන ACNC හෝ කොමන්වෙල්ත් රජය මගින් අනුමත කිරීම කිසිම ආකාරයකින් අදහස් කල නොහැක).

මෙම ප්‍රකාශනය 2015 ජුනි මාසයට තත්කාලීනවේ